**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - 2016**

**---------------------------------------------------**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ අංක 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**------------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

---

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව බව දක්වා තිබුණද මධ්‍යස්ථානය විසින් ඊට පටහැනිව මිල දී ගත් වර්ෂයේදී ක්ෂය නොකිරීමටත්, අපහරණය කරනු ලබන වර්ෂයේදී සම්පූර්ණයෙන් ක්ෂය කිරීමටත් ප්‍රතිපත්තියක් හඳුනාගෙන තිබුණි. කෙසේවුවද 2013 වර්ෂයට පෙර මධ්‍යස්ථානය විසින් වත්කම් මිලදී ගත් වර්ෂයේ සිට ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

#### 2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

2010 මැයි 10 දින සේවය අවසන් කරන ලද නිලධාරියෙකුගෙන් හා 2014 ජනවාරි 06 දින වාහනයක් අනවසරයෙන් ධාවනය කර අනතුරකට ලක්වීම නිසා අදාළ නිලධාරියාගෙන් මධ්‍යස්ථානයට අයවිය යුතු පිළිවෙලින් රු.256,589 ක් සහ රු. 165,645 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යස්ථානය විසින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රේෂණය කරනු ලබන අරමුදල් උපයෝජනය කළ ආකාරය සහ අදාළ ව්‍යාපෘති වල භෞතික ප්‍රගතිය පිළිබඳ තොරතුරු කාලීනව දැනුම් නොදෙන බව විගණනයේදී නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුල පිරිවැය රු. 142,104,047 ක් වූ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 48 ක් මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කර තිබුණු නමුත් ඒවායේ වැඩ අවසන් කිරීමේ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. ඒ හේතුවෙන් එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය මෙන්ම ඒවායේ ඵලදායීභාවය විගණනය කිරීමට නොහැකි විය.

(ආ) මධ්‍යස්ථානයේ ස්ථාවර වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණු පිරිවැය රු.5,475,000 ක් වූ බැකෝ ලෝඩරය සම්බන්ධයෙන් භෞතික පරීක්ෂණ වාර්තා සහ අනෙකුත් උපයෝගී වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොවිය.

(ඇ) එකම තක්සේරු වටිනාකමක් සහිත මෝටර් වාහන 30ක් සඳහා විවිධ තක්සේරු වටිනාකම් යටතේ රක්ෂණ වාරික ගෙවා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද සමාලෝචිත වර්ෂය සඳහා ගෙවා තිබුණු රු.2,284,431 ක් වූ මෝටර් වාහන 38 ක රක්ෂණ වාරික ගණනය කිරීමේ පදනම විගණනයට පැහැදිළි කර නොතිබුණි.

(ඇ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 05 ඡේදය | පනතේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂිකව අවම වශයෙන් රැස්වීම් වාර 04 ක් වත් පැවැත්විය යුතු බව සඳහන් වුවත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ආරම්භක දින වූ 2005 ඔක්තෝබර් 12 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 11 ක කාලසීමාව තුල පවත්වා තිබුණේ රැස්වීම් වාර 10 පමණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | |
| | (i) මුදල් රෙගුලාසි 395 (ඇ) | මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන ඊලග මාසයේ 15 දිනට පෙර පිළියෙල කළ යුතු වුවත් 2016 ජූලි මස සිට 2016 නොවැම්බර් මාසය දක්වා මධ්‍යස්ථානයේ බැංකු සැසඳුම් ප්‍රකාශන ප්‍රමාදයන් සහිතව පිළියෙල කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර 2016 දෙසැම්බර් මාසයට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර තිබුණේ 2017 මාර්තු 22 දිනදීය. |
| | (ii) මුදල් රෙගුලාසි 104 | සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 11 කදී සිදු වී තිබුණු මෝටර් වාහන අනතුරු 09 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවන් හෝ පූර්ණ වාර්තා සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ඇ)** | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | (i) 3.4.3 මාර්ගෝපදේශය | මධ්‍යස්ථානයේ ප්‍රසම්පාදන කටයුතු සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) 4.2.1 (ආ) මාර්ගෝපදේශය | අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් විය යුතු වුවත් මධ්‍යස්ථානය විසින් පිළියෙල කළ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් කර තිබුණේ සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රසම්පාදන කටයුතු පමණි. |

| | | |
|---|---|---|
| (iii) | 2014 ජූලි 04 දිනැති ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 28 | වටිනාකම රු. 200,000 ක් ඉක්මවන මෝටර් රථ අළුත්වැඩියාවන් සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ පෞද්ගලික අනුමැතිය ලබාගත යුතු වුවද එකතු වටිනාකම රු.1,643,434 ක් වූ මෝටර් වාහන අළුත්වැඩියා 04 ක් සඳහා එවැනි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සහා මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,159,474 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.12,255,473 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,095,999 ක වර්ධනයක් නිරීක්ෂණය විය. වෙනත් ආදායම් රු.11,634,074 කින් අඩු වුවද රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.27,880,486 කින් වැඩි විම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂයේදී අතිරික්තයක් පැවතියද අනෙකුත් වර්ෂ 04 හි මූල්‍ය ඌනතාවයන් පැවතුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමේදී 2012 වර්ෂයේදී රු.272,154,844 ක්වූ දායකත්වය උච්චාවචනයන් සහිතව 2016 වර්ෂයේදී රු.238,364,189 ක් වී තිබුණි.

### 3.2 මධ්‍යස්ථානයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

-----------------------------------------------------------------------

2012 අගෝස්තු 16 දින මධ්‍යස්ථානය සතුව තිබුණු මෝටර් වාහනයක් අනතුරට ලක් වී පුද්ගලයකු මිය යාම හේතුවෙන් අගතියට පත් පාර්ශවය විසින් 2014 අගෝස්තු 07 දින මඩකලපුව දිස්ත්‍රික් අධිකරණයේ මධ්‍යස්ථානයට එරෙහිව නඩුවක් පවරා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

### 4.1 කාර්යසාධනය

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනතේ සඳහන් පරිදි නම් කරන ලද ප්‍රධාන අවදානම් 21 ක් අවම කිරීම සඳහා මධ්‍යස්ථානය විසින් කටයුතු කළයුතුව තිබුණද, 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාල සීමාව තුලදී එම අවදානම් වලින් 04 ක් සඳහා පමණක් මූලිකත්වය දී කටයුතු කර තිබුණි. යථෝක්ත කාලපරිච්ඡේදය වෙනුවෙන් මධ්‍යස්ථානය විසින් ආපදා අවම කිරීම් සඳහා දරන ලද රු. මිලියන 1,749.42 ක මුළු වියදමින් ගංවතුර අවදානම අවම කිරීම සඳහා සියයට 63 ක්ද, නියඟය මගින් වියහැකි ව්‍යසන අවම කිරීම සඳහා සියයට 22 ක්ද, නායයාම් අවදානම අවම කිරීම සඳහා සියයට 08 ක්ද යොදවා තිබුණු අතර, නම් කරන ලද ඉතිරි ආපදා 18 ක් සම්බන්ධ ආපදා අවදානම් අවම කිරීම් සඳහා මුළු වියදමින් සියයට 07 ක් පමණක් යොදවා තිබුණි.

(ආ) මධ්‍යස්ථානයේ පෙර සූදානම් අංශය මගින් දිස්ත්‍රික් , ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් ආපදා කළමනාකරණ සැලසුම් වාර්ෂිකව සකස්කර ඉදිරිපත් කලයුතු වුවත් දිස්ත්‍රික්ක 13 ක් සම්බන්ධයෙන් වූ සැලසුම් වසර 03 කට වඩා පැරණි බව නිරීක්ෂණය විය. තවද ඉදිරිපත් කර තිබුණු සැළසුම් අනුව දිස්ත්‍රික්ක වල ඉහල ආපදා අවදානම් තිබෙන ග්‍රාම සේවා වසම් සංඛ්‍යාව නිශ්චිතව හඳුනාගැනීමට නොහැකි විය. දිස්ත්‍රික් සැලැස්මේ ප්‍රධාන අංගයක් වූ දිස්ත්‍රික්කයේ අවදානම තක්සේරු කිරීම සඳහා වන පෙරසූදානම් සැලැස්ම, හදිසි ප්‍රතිචාර දක්වන සැලැස්ම සහ පුනරුත්ථාපන සැලැස්ම යන සැලසුම් තුල එකී අවදානම් තක්සේරු කිරීමේ යාන්ත්‍රණය හඳුනාගත නොහැකිවීම හේතුවෙන්, එම සැලසුම් නිවැරදිව ක්‍රියාත්මක කලහැකි ක්‍රියාවලියක ස්වරූපයෙන් හඳුනාගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.247,000,000 ක් වූ භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ සංවර්ධන බහු උපද්‍රව අවදානම් දැරීමේ ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයේ රු.68,000,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී රු.10,804,000 ක වියදමක් දරා ව්‍යාපෘතියට අදාල මෘදුකාංග පද්ධතිය හා පරිගණක උපාංග මිලදී ගැනීම පමණක් සිදු කර තිබුණද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ සඳහා ක්‍රියාකාරී සැලැස්මක් හා ප්‍රගති වාර්තාවක්ද ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) මහා පරිමාණ ව්‍යාපෘතියක් වශයෙන් මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කර තිබුණු දඹුල්ල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- මෙම ව්‍යාපෘතිය යටතේ තම්මැන්නා ඇළ පුළුල් කිරීම හා ඉවුරු බැම් ඉදිකිරීම් සඳහා කර්මාන්ත 07කට අදාළව රු.මිලියන 42 ක් ඇස්තමේන්තු කර තිබුණු නමුත් ඒ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් කළ බවට සාක්ෂි ලැබී නොතිබුණු බැවින් ව්‍යාපෘතියේ අවශ්‍යතාවය හා ඵලදායිතාවය පිළිබඳ තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය.
- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 වගන්තිය අනුව කර්මාන්ත 7 සඳහාම මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කළයුතු වුවද එසේ නොකර කොටස් වශයෙන් ඇස්තමේන්තු සකස් කර තිබුණි.

- කර්මාන්ත 7 න් 3 ක් භෞතිකව පරීක්ෂා කිරීමේදී ගේබියන් තාප්ප ඉදිකිරීම් වෙනුවෙන් රු.5,459,000 ක් ගෙවා තිබුණද ඒ සඳහා නියමිත ප්‍රමාණයෙන් යුතු කළුගල් භාවිතා නොකිරීම නිසා ඒවා නිසි ආකාරව බද්ධ වීමක් සිදු වී නොතිබුණි. තවද, බැම් පිටුපස බොරළු දමා ජලය යොදා තැලීම වෙනුවෙන් රු.342,498 ක් ගෙවීම් කර තිබුණද බොරළු වෙනුවට පස් යොදා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කරනු ලබන දිස්ත්‍රික් මට්ටමේ ආපදා අවම කිරීම සඳහා වූ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- ව්‍යාපෘතියක් සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දීමට ප්‍රථම විධිමත් ව්‍යාපෘති යෝජනාවලියක් සකස් කළ යුතු වුවත් එසේ නොමැතිව දිස්ත්‍රික්ක 08 ක ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 31 ක් වෙනුවෙන් ඇස්තමේන්තු වටිනාකම රු.121,945,689 ක් වූ මුදල් අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රේෂණය කර තිබුණි.

- තවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වැඩ ඇස්තමේන්තු නිසියාකාරව සකස් කර නොතිබීම හේතුවෙන් සියයට 15 සිට සියයට 66 ක පරාසයක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රේෂණය කළ මුදලින් ව්‍යාපෘති නිම කර ඉතිරි වූ මුදල් 2016 දෙසැම්බර් 31 දිනට පෙර මධ්‍යස්ථානය වෙත ලබා දියයුතු වුවත් අනුරාධපුර, රත්නපුර හා කුරුණෑගල දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 31 කින් ඉතිරි වූ රු.8,889,449 ක මුදල එම කාර්යාලවලින් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අදාලව පරිපාලන වියදම ගණනය කිරීමේදී නිශ්චිත පදනමක් යොදා නොගෙන විවිධ පදනම් යටතේ පරිපාලන වියදම ගණනය කර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 18 වගන්තිය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම සඳහා බලය ලබා දී තිබුණි. එසේම මෙම පනත ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් සංශෝධනය කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණු අතර නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව මඟින් 2017 ජූනි 22 දින පනතේ සංශෝධන නැවත සලකා බලා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සඳහා ආපසු එවා තිබුණි.

(ආ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක රු.1,034,399,368 ක වියදමක් දරා 2010 වර්ෂයේදී මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකර තිබුණු නමුත් එම ඉඩම සහ ගොඩනැගිල්ල මධ්‍යස්ථානය වෙත පවරා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ වෙනත් රාජ්‍ය නොවන සංවිධාන මඟින් මධ්‍යස්ථානය වෙත ලැබී තිබුණු යතුරු පැදි 18ක වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඒවායේ ධාවන තත්ත්වය , භාරකාරත්වය පිළිබඳ වගකියනු ලබන පාර්ශවයන් යනාදී කරුණු සම්බන්ධ පසු පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම වත්කම් අයථා පරිහරණය මෙන්ම වත්කමේ පැවැත්ම පිළිබඳවද ගැටළු ඇතිවිය හැකි බව විගණනයේ අදහසයි.

## 4.3 වත්කම් පාලනය

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ''හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වර්ධනය කිරීම'' වෙනුවෙන් මධ්‍යස්ථානය විසින් මිලදී ගන්නා ලද පිරිවැය රු.5,000,000 ක් වූ වතුර බවුසරය මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පැවරීම වෙනුවෙන් 2014 මාර්තු 14 දින ගිවිසුමක් ඇති කරගෙන තිබුණි. කෙසේ වුවද එම කාර්යාලය වෙත වතුර බවුසරය ලබාදී තිබුණද 2017 ජූනි 23 දින දක්වාම එහි අයිතිය නිත්‍යානුකූලව පැවරීමක් සිදුකර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් කාර්යාලවල පැවති 2008 වර්ෂයේ සිට ඉවත් කළ යුතු බවට භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් නිර්දේශ කරන ලද භාණ්ඩ විෂයයන් 62 ක් ඉවත් කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය 2017 පෙබරවාරි මාසය දක්වාම මධ්‍යස්ථානය විසින් ලබා දී නොතිබුණි.

## 4.4 මූල්‍ය කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය රු.18,023,370 ක් බව තහවුරු වුවද 2016 දෙසැම්බර් 31 දාතමින් නිකුත් කරන ලද රු.67,231,890 ක චෙක්පත් 162 ක් සහ රු.79,562,441 ක ලදුපත් 45 ක් 2016 වර්ෂය තුළ සිදුකරන ලද ගෙවීම් සහ ලැබීම් ලෙස සලකා 2017 ජනවාරි 01 දින සිට ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට මුදල් පොතේ ශේෂය රු.30,353,922 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මේ අනුව ගිණුම් වර්ෂය ඉකුත් වීමෙන් පසුවද පරිගණක ගත ගිණුම් පද්ධතිය විවෘතව තබා ගනිමින් ගනුදෙනු සටහන් කිරීමට නිළධාරීන් කටයුතු කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රජයේ අයවැය ඇස්තමේන්තුවේ මූලධන හා පුනරාවර්තන වියදම් සඳහා පිළිවෙලින් රු.770,500,000 ක් හා රු.12,500,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද භාණ්ඩාගාරය විසින් නිදහස් කරන ලද මුදල පිළිවෙලින් රු.504,670,000 ක් හා රු.1,500,000 ක් පමණක් වූ අතර එනම්, එය ඇස්තමේන්තුවෙන් සියයට 65 ක් හා සියයට 12 ක් විය. ඒ අනුව වර්ෂය තුළ සිදුකිරීමට අපේක්ෂිත මූලධන හා පුනරාවර්තන වියදම් සඳහා අවශ්‍ය මුදල් භාණ්ඩාගාරයෙන් ලබාගැනීමට මධ්‍යස්ථානය විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 මාර්තු 13 වන දින පුද්ගලික ආයතනයක් විසින් මධ්‍යස්ථානය වෙත පරිත්‍යාග වශයෙන් ලබාදී තිබූ රු.2,000,000 ක මුදලින් 2016 දෙසැම්බර් 31 දින වන විට රු.1,000,000 ක් උපයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) සියළුම ආකාරයේ ආපදාවන් අවම කිරීම සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූලව 2015 වර්ෂයේ සිට 2030 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා "සෙන්දායි රාමුව" නමින් වූ සැලැස්මක් සැකසීමට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2015 වර්ෂයේදී මධ්‍යස්ථානයට ලබා දී තිබුණු රු.1,300,000 ක ප්‍රදානයෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට විවිධ කටයුතු සඳහා රු.318,583 ක් වියදම් කර තිබුණ ද සෙන්දායි රාමුවට අනුව සැලසුම් පිළියෙල කිරීමේ කාර්යය සම්පූර්ණ කිරීමට මධ්‍යස්ථානය කටයුතු කර නොතිබුණි.

(ඉ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීම සඳහා ප්‍රදානයක් ලෙස 2015 ජූලි 07 වන දින ලබාදී තිබුණු රු.1,500,000 ක මුදලින් 2017 මැයි 19 වන දින වන විට රු. 396,000 ක් උපයෝජනය කර තිබුණද අදාල සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

හදිසි අවශ්‍යතා සඳහා මධ්‍යස්ථානයේ ප්‍රතිපාදනවලින් 2014 ජූලි හා ඔක්තෝබර් මාසවලදී මිලදීගෙන තිබුණු ආපදා සහන සේවකයින් හඳුනාගැනීමේ කබා තොග වලින් රු.1,483,515 ක් වටිනා ඒකක 2997 ක් 2016 දෙසැම්බර් 31 දින වන විට ගබඩාවේ ඉතිරි වී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ ඒකක 351 ක් පමණක් පරිහරණය කර තිබුණි. මෙසේ කබා ඉතිරිව පැවතියදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ලද මූල්‍ය ප්‍රදානයන් උපයෝගී කරගෙන 2015 ජනවාරි මාසයේදී රු.990,000 ක පිරිවැයකට කබා 2000 ක් මිලදීගෙන තිබුණු අතර එයද 2016 දෙසැම්බර් 31 දින වන තෙක් භාවිතයෙන් තොරව ගබඩාවේ රඳවා තිබුණි.

**4.6 ආර්ථික නොවූ ගනුදෙනු**

වටිනාකම රු 17,081,640 ක් වූ බෝට්ටු 70 ක් හා දම්වැල් කියත් 72ක් 2016 නොවැම්බර් 28 දිනට පෙර සැපයීම සඳහා මධ්‍යස්ථානය විසින් තෝරාගත් සැපයුම්කරුවන් එකඟවී තිබුණු නමුත් අදාල ඇණවුම සම්පූර්ණ කර තිබුණේ 2016 දෙසැම්බර් 14 හා දෙසැම්බර් 31 යන දිනවල දීය. ඒ හේතුවෙන්, ප්‍රමාද කාලය තුළ එකතු කළ අගය මත අනුපාත වෙනස්වීම මත එකතුව රු. 616,960 ක මුදලක් වැට් බදු වශයෙන් වැඩිපුර ගෙවා තිබුණි.

**4.7 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානයේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ පානීය ජල ළිං ඉදිකිරීම පිළිබඳව සිදුකරන ලද භෞතික පරීක්ෂාවන්ට අනුව පහත සඳහන් නිරීක්ෂණ කෙරේ.

(i) 2016 නොවැම්බර් 30 දින අත්සන් කරන ලද ගිවිසුමට අනුව කටුගම්පල ප්‍රදේශයේ පානීය ජල ළිඳක් ඉදිකිරීමේ කටයුතු මාසයක් තුල නිමකල යුතුව තිබුණද 2017 ජනවාරි 26 දින වනවිටත් වැඩ අවසන් කර නොතිබුණි. එහෙත් කොන්ත්‍රාත්තුව ලබාගත් ප්‍රජාමූල සංවිධානය විසින් නියමිත දිනට කාර්යය නිමකර ඇති බවට සාවද්‍ය වාර්තාවක්ද මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කර තිබුණි.

(ii) පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුල ඇස්තමේන්තු වටිනාකම රු.4,033,835 ක්වූ පානීය ජල ළිං 05 ක් ඉදිකර තිබුණ ද විගණිත දිනය වූ 2017 ජනවාරි 26 දින වන විටත් එම ළිං පානීය ජලය පරිභෝජනයට සුදුසු තත්ත්වයකට පත්කර නොතිබුණි.

(ආ) මධ්‍යස්ථානය විසින් පුද්ගලික සමාගමක් සමඟ සුනාමි කුළුණු 77 ක් ප්‍රතිසංස්කරණය හා අළුත්වැඩියාව සඳහා රු.134,746,419 ක වැට් බදු ඇතුලත් වටිනාකමක් සහිත ගිවිසුමකට 2016 දෙසැම්බර් 16 දින එළඹ තිබුණු අතර රු.8,345,898 ක අත්තිකාරම් මුදලක් 2016 දෙසැම්බර් 21 දින ගෙවා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව දින 90 කින් අදාල කාර්යය නිම කලයුතු වුවද 2017 ජුනි 30 දින වනතෙක්ම එම කාර්යය නිම කර නොතිබුණි.

ගිවිසුමට අනුකූලව මාස 06 ක කාලයක් ගත වී තිබියදීත් පූර්ව අනතුරු ඇඟවීම් කුළුණු ප්‍රතිසංස්කරණය කිරීමට නොහැකි වීමට හේතු ලෙස අයහපත් කාළගුණය,තාක්ෂණික උපකරණ ලබාගැනීමේ ප්‍රමාදය ,ශ්‍රී ලංකා යුධ හමුදාවේ සංඥා බලකායේ නිලධාරින් එක් එක් කුළුණ වෙත ගොස් පරීක්ෂා කිරීමට කාලය ගත වීම හේතු වූ බව අධ්‍යක්ෂ ජනරාල් විසින් මා වෙත දන්වා තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 21 දින ප්‍රසම්පාදන සැලසුම අනුව, හදිසි අවස්ථා මිලදී ගැනීම් වෙනුවෙන් ප්‍රතිපාදනය කරන ලද රු.මිලියන 54.8 කින් අයිතම වර්ග 19 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා රු.941,794 ක වියදමක් දරා පුවත්පත් දැන්වීම් පළකර තිබුණි. කෙසේ වුවද රු.මිලියන 12.859 ක් වූ අයිතම වර්ග 04 කට අදාල භාණ්ඩ වර්ග 1213 ක ප්‍රසම්පාදන කටයුතු, මධ්‍යස්ථානය විසින් අවලංගු කර තිබුණි. දම්වැල් කප්පි 55 ක් මිලදී ගැනීම සඳහා 2016 දෙසැම්බර් 22 දින රු.4,243,250 ක බදු රහිත මිලකට ලංසු ප්‍රදානය කර තිබුණද 2017 මාර්තු 23 දින වන විටත් මිලදී ගැනීම් සිදුකර නොතිබුණි.

(ඇ) අකුරණ ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තු සකස් කිරීමට පෙර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය විසින් 2014 ඔක්තෝබර් මස සිදුකල පරිශ්‍රයේ අධ්‍යයන වාර්තාවේ සඳහන් මූලික කරුණුවලට අවධානය යොමු කර නොතිබුණ බැවින් මහා මාර්ගයේ පටු ස්ථානවල ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට හා පටු ස්ථාන පළල් කිරීම සඳහා කිසිදු මුදලක් ප්‍රතිපාදනය කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ මඩ ඝන මීටර් 12700 ක් ඉවත් කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකු වෙත රු.18,122,900 ක් ගෙවා තිබුණ අතර ඉවත් කරන මඩ ධාරිතාවය සහතික කිරීම තාවකාලික පදනම මත වූ වැඩ පරීක්ෂක වරයෙකු විසින් සිදුකර තිබුණි.යථෝක්ත ව්‍යාපෘතියේ මඩ ඝන මීටර් 486.76 ක් ඉවත් කර තිබුණු අතර ඒ සඳහා නියමිත වැඩ වටිනාකම රු.694,606 ක් වන නමුත් අදාල කොන්ත්‍රාත්කරු වෙත රු.17,428,294 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. ව්‍යාපෘති ගිවිසුම අනුව වැඩ අවසන් කළ යුතු දිනය 2015 නොවැම්බර් 14 දින වුවත් 2016 පෙබරවාරි 29 දින වන විටත් වැඩ අවසන් වී නොතිබුණු අතර ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම සඳහා අනුමැතියක් ලබාදී නොතිබුණි.ව්‍යාපෘතියේ ප්‍රමාද දිනයක් සඳහා දිනකට රු.4,700 ක් බැගින් වූ දඩ මුදලක් අය කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ඉ) බදුල්ල දිස්ත්‍රික්කයේ කෙහෙල්ඇල්ල ශ්‍රී ආනන්දාරාමයේ ආරක්ෂාව සඳහා රු.1,569,490 වැය කර ඉදි කළ කොන්ක්‍රීට් බැම්ම පසුපස පස් පිරවුම නිසිපරිදි තලා මට්ටම් කර නොතිබුණු අතර බැම්මට ඉහලින් පිහිටි භූමියෙන් ගලා එන ජලය ඍජුව බැම්ම පිටුපස තැන්පත් වීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සඳහා අනුමත තනතුරු සංඛ්‍යාව 344 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 17 ක නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාව 114 ක් වී තිබුණි. එම පුරප්පාඩු වලින් තනතුරු 15 ක නිලධාරි පුරප්පාඩු 62 ක් සම්පූර්ණ කිරීම සඳහා පුවත්පත් දැන්වීම් හා සම්මුඛ පරීක්ෂණ සඳහා රු.806,269 ක් වැයකර තිබුණද, 2017 ජුනි 30 දින වනවිටත් ඉන් තතතුරු නාම 09 ක පුරප්පාඩු 46 ක් සම්පූර්ණ කිරීමට මධ්‍යස්ථානය අපොහොසත් වී තිබුණි. තවද රියදුරු තනතුරු 04 ක් හා කාර්යාල කාර්ය සහායක තනතුරු 25 ක් සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පල නොකර අභ්‍යන්තර කැඳවීම් කර තිබුණ අතර තවදුරටත් රියදුරු තනතුරු 04 ක් පුරප්පාඩුව පැවතුණි.

(ආ) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් සිදු කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් බවත් පූර්ණකාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත් කිරීම් නොපමාව සිදු කළ යුතු බවත් දක්වා තිබුණු නමුත්,ඊට අනුකූල නොවන පරිදි මාස 06 සිට මාස 35 දක්වා වූ කාල පරාසයක් සඳහා මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 04 ක සහ සහකාර අධ්‍යක්ෂ තනතුරු 01 ක වැඩබැලීම වෙනුවෙන් මධ්‍යස්ථානයේ නිලධාරීන් 05 දෙනෙකු වෙත රු.658,558 ක වැඩ බැලීමේ දීමනා ලබා දී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සෑම රාජ්‍ය සංස්ථාවකටම හා සම්බන්ධ කෙටුම්පත් වාර්ෂික වාර්තා හා ගිණුම් මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මධ්‍යස්ථානය විසින් 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 01 දින ඉදිරිපත් කර තිබුණු නමුත් සංශෝධිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 2017 මැයි 09 දින දක්වා ප්‍රමාද කර තිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

---------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලසුම් 2016 දෙසැම්බර් 27 දින සංශෝධනය කර තිබුණු බැවින් සැලසුමකින් අපේක්ෂිත පරමාර්ථ ඉටු නොවුනු බව නිරීක්ෂණය විය. සංශෝධිත සැලැස්ම අනුව රු.මිලියන 100.1 ක මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 25.3 ක් පුනරාවර්තන මිලදී ගැනීම් සඳහාද, රු.මිලියන 54.8 ක් හදිසි අවස්ථා ප්‍රසම්පාදන කටයුතු සඳහාද ඉතිරි රු.මිලියන 20 ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම සඳහාද වෙන් කර තිබුණි. කෙසේ වුවද , වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් සියයට 98.93 ක් වූ රු.මිලියන 74 ක මුදල භාණ්ඩාගාරයෙන් නිදහස් කර තිබුණේ 2016 දෙසැම්බර් මාසයේදී වූ බැවින් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදනයන් සඳහා ඉහත මුදල් නිසි පරිදි උපයෝජනය කරගැනීමට මධ්‍යස්ථානයට නොහැකි වී තිබුණි.

### 5.3 ක්‍රියාකාරී සැලැස්ම

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 ක්‍රියාකාරී සැලැස්මට අනුව ආපදා අවම කිරීම් ව්‍යාපෘති 37 ක් සහ ප්‍රතිපාදන වටිනාකම රු.511,853,709 ක් ලෙස සඳහන් වුවද ප්‍රගති වාර්තා වලට අනුව ව්‍යාපෘති ගණන 157 ක් සහ ප්‍රතිපාදන වටිනාකම රු.713,849,427 ලෙස සඳහන් කර තිබුණි. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, පැවතින තත්ත්වයන් අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී යම් යම් වෙනස්කම්වලට භාජනය කිරීමට සිදුවීම ඒ සඳහා හේතු වී ඇති බව මධ්‍යස්ථානය විසින් දක්වා තිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී හා එහි එක් එක් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීමේදී ව්‍යාපෘති පිළිබඳ ශක්‍යතා අධ්‍යනයක් සිදු කර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව සහ ඉන් ලැබෙන ප්‍රතිලාභ අධ්‍යයනය කළ යුතු වුවත් එසේ නොකිරීම හේතුවෙන් රු.76,685,049 ක ප්‍රතිපාදන වෙන්කරන ලද ව්‍යාපෘති 21 ක් විවිධ හේතූන් නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-----------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගබඩා පාලනය | (i) කාර්යාලය විසින් භාවිතා කරන හා බෙදා හැරීම සඳහා ගබඩාවේ ඇති භාණ්ඩ එකම බඩු වට්ටෝරු පොතක ඇතුළත් කර තිබීමෙන් භාණ්ඩ වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට නොහැකි වීම. |
| | (ii) 2017 ජනවාරි 07 දින තොග පොත විගණනය කර පියවීමෙන් පසුව භාණ්ඩ වර්ග 23 ට අදාලව 2016 වර්ෂයට අදාලව සටහන් ඇතුළත් කර තිබීම. |
| | (iii) භාණ්ඩ වර්ග 05 කින් අයිතම 3,352 ක් ගබඩාවට ලැබුණු දිනය භාණ්ඩ ලැබීම් පත්‍රිකා අනුව 2016 දෙසැම්බර් 31 දින වුවත් එයට වෙනස් දිනයන් යටතේ තොග පොතට ඇතුළත් කර තිබීම. |
| | (iv) භාණ්ඩ වර්ග 05 කින් අයිතම 3313 ක් සැපයුම්කරු විසින් සැපයීමට එකඟ වූ දිනට වඩා දින 14 සිට දින 36 ක් දක්වා ප්‍රමාද වී සපයා තිබීම. |
| | (v) දිස්ත්‍රික් කාර්යාල 03 කට අනුයුක්ත කර ඇති වාහන 03 ක් සම්බන්ධ විස්තර භෞතික පරීක්ෂණ වාර්තාවල ඉදිරිපත් කර නොතිබීම. |
| (ආ) ගිණුම්කරණය | (i) ගෙවිය යුතු තැන්පතු මුදල් නිරවුල් කිරීමට කටයුතු නොකර දිගින් දිගටම ගිණුම්වල දැක්වීම. |
| | (ii) වියදම් නිවැරදිව ගණනය කර ගිණුම්ගත නොකිරීම. |
| (ඇ) වත්කම් පවරා ගැනීම | මධ්‍යස්ථානය විසින් භාවිතා කරනු ලබන වාහන 39 කින් වාහන 31 ක අයිතිය මධ්‍යස්ථානය වෙත පවරා නොගැනීම. |